# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) (සංස්ථාගත කිරීමේ)

සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධන උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

---

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි විසින්
2015 මාර්තු මස 17 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 මාර්තු මස 09 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[337 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 11.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

2—PL 008850—225 (2015/03)

# සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) (සංස්ථාගත කිරීමේ)

**සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

**පූර්විකාව.**

‘‘සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED)’’ යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක්, එකී ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එකී ආයතනය සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යෑමේ කාර්ය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති හෙයින් ද:

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එම පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, සහ එකී ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එම ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 2015 අංක     දරන සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) සංස්ථාගත කිරීම.**

2. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු ‘‘ආයතනය’’ යනුවෙන් සඳහන් කරනු ලබන) සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනයේ දැනට සාමාජිකයන් වශයෙන් සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් ද (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි මෙන්ම, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය එකී සංස්ථාවට තිබිය යුතු ය.

2—PL 008789—325 (2015/02)

(2) සංස්ථාව, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ඔලිම්පික් ක්‍රීඩා ප්‍රතිපත්ති සහ වටිනාකම් නගාසිටුවීම සඳහා සහ ඔලිම්පික් ක්‍රීඩා කටයුතු සඳහා උපකාර කිරීම පිණිස පසුබිමක් සකස් කිරීම මගින් ජාත්‍යන්තර ක්‍රීඩා කටයුතුවලදී ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාතික රටවල කාර්ය සාධනය වැඩි දියුණු කිරීම;

(ආ) ජාතික සහ කලාපීය සාමය ගොඩනැගීම සහ ගැටුම් වැළැක්වීම සඳහා දායකත්වය ලබාගැනීම සඳහා ක්‍රීඩාවේ ශක්‍යතාවය උපරිම වශයෙන් භාවිතා කිරීම සහ සංවර්ධනය සහ සාමය උදෙසා ක්‍රීඩාව සහ ශීර්ෂය යටතේ සාමය, අධ්‍යාපනය සහ සමාජ ඒකාබද්ධතාවය සඳහා වූ මෙවලමක් වශයෙන් ක්‍රීඩාව භාවිත කරමින් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සංවර්ධන ඉලක්ක අත්කර ගැනීම;

(ඇ) සම්පත්, සේවා සහ පහසුකම් සඳහා ප්‍රවේශයක් නිර්මාණය කිරීම තුළින් ශ්‍රී ලංකාවේ වෘත්තීය, සාම්ප්‍රදායික සහ විනෝදජනක ක්‍රීඩා ප්‍රවර්ධනය කිරීම;

(ඈ) කාන්තාවන්ගේ කාර්ය සාධනය සහ උන්නතිය සඳහා උපකාර කිරීම තුළින් ප්‍රමිතිරි සමානත්වයක් සහ කාන්තා බලගැන්වීම ප්‍රවර්ධනය කිරීම සහ විශේෂයෙන්ම ජාත්‍යන්තර ක්‍රීඩා ඉසව්වල දී කාන්තාවන්ගේ ඉහළ කාර්ය සාධන ප්‍රගතියක් ඇති කිරීම;

(ඉ) සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා ප්‍රවාහකයන් වශයෙන් ක්‍රීඩාව භාවිත කිරීම, ප්‍රවර්ධනය සහ ශාරීරික අධ්‍යාපනය තුළින් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවීම වැළැක්වීම, අශක්නුතා සහිත

තැනැත්තන් ක්‍රීඩාවට ඇතුළත්කර ගැනීම සහ ඔවුන්ගේ සුභසිද්ධිය ප්‍රවර්ධනය කිරීම සහ ආන්තික කණ්ඩායම් සමාජීය ලෙස ඇතුළත් කර ගැනීම සඳහා පහසුකම් සැළැස්වීම ප්‍රවර්ධනය කිරීම;

(ඊ) දකුණු ආසියාතික පිරිමි සහ කාන්තාවන්ගේ අධ්‍යාපන සහ වෘත්තීය කුසලතා මෙන්ම ඔවුන්ගේ වෙනත් පුද්ගලික ප්‍රවර්ධන දෘෂ්ටීන් සාක්ෂාත් කරනු ලබමින් ඔවුන්ගේ ක්‍රීඩා කුසලතා ඉදිරියට ගෙනයෑම සහ ජයග්‍රහණය කිරීම සඳහා හැකිවන පරිදි ඔවුන්ට සම්පත්, සේවා සහ පහසුකම් සැපයීම; සහ

(උ) ක්‍රීඩා විද්‍යාව, ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව, ශාරීරික අධ්‍යාපන සහ ක්‍රීඩා ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සහ ප්‍රවර්ධන පහසුකම් ඇතුලුව ක්‍රීඩාව පිළිබඳ දකුණු ආසියාතික අධ්‍යාපන කේන්ද්‍රයක් ඇති කිරීම.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කොට ඇති පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී, එකී පරමාර්ථ, වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය, උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත පදනම් කරගත් වෙනස්කමකට භාජනය නොවන පරිදි ක්‍රියාත්මක කිරීමට සංස්ථාව විසින් වගබලා ගත යුතු ය.

*ආණ්ඩුවේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්ය සමග සංස්ථාවේ කාර්ය ගැටුම් සහගත නොවන බවට සංස්ථාව වගබලා ගත යුතු බව.*

**4.** ආණ්ඩුවේ හෝ පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාවේ කාර්ය අතර, කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කළ යුතු ය.

*සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.*

**5.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය, මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීති මගින් නිශ්චය කරනු ලැබිය

හැකි ධූර දරන්නන් යම් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ක්‍රියාකාරී සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධූර දරනු ලැබූ ආයතනයේ සභාව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රථම සභාව පත් කරනු ලබන හෝ තෝරා පත් කරනු ලබන තෙක් සංස්ථාවේ සභාව වශයෙන් ක්‍රියා කළ යුතු ය.

(ආ) සංස්ථාවේ ප්‍රථම සභාව මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ සිට එක් අවුරුද්දක කාලයක් ඇතුළත පත් කිරීම හෝ තෝරාපත් කර ගැනීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරු සහ උපදේශකවරු ද ඇතුළුව සභාවේ සෑම ධූර දරන්නකුම වර්ෂ තුනක කාලයක් සඳහා පත් කර ගත යුතු හෝ තෝරාපත් කරගත යුතු අතර, ඒ වර්ෂ තුනක කාලසීමාව ඉකුත්වීමෙන් පසුව ඒ ධූර දරන්නා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත්කර ගැනීම හෝ තෝරාපත්කර ගැනීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(ආ) යම් ධූර දරන්නකු මියයාම, ඉල්ලා අස්වීම, නොහැකියාවකට පත්වීම හෝ ධූරයෙන් ඉවත් කිරීම නිසා ධූරයේ පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, සභාව විසින් සංස්ථාවේ රීති සැළකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත් කරගත යුතු හෝ පත් කරගත යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරාපත් කර ගනු ලබන හෝ පත්කර ගනු ලබන තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධූර දැරිය යුතු ය.

සංස්ථාවේ බලතල.

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා පහත සඳහන් අවශ්‍ය හෝ අපේක්ෂිත සියලු ක්‍රියා හා කාරණා කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ බලය සංස්ථාවට තිබිය යුතු ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට

ගැනීමට, ඉදිකිරීමට, අළුත්වැඩියා කිරීමට සහ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සුදුසු යැයි සැළකෙන අයුරින් ඒවා සම්බන්ධයෙන් ක්‍රියාකිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) ක්‍රීඩා සහ ක්‍රීඩා ආශ්‍රිත ක්ෂේත්‍ර සඳහා අදාළවන වැඩසටහන් සහ ක්‍රීඩා ඉසව් සංවිධානය කිරීම;

(ඇ) සංස්ථාව විසින් තමා වෙනුවෙන් යම් නිලධරයකු හෝ නියෝජිතයකු මගින් සෘජුව හෝ වක්‍රව සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා හෝ සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු කොන්ත්‍රාත් හෝ ගිවිසුම්වලට ඇතුළත් වීම සහ එම කොන්ත්‍රාත් සහ ගිවිසුම් ඉටුකිරීම හෝ පවත්වාගෙන යෑම;

(ඈ) ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම සහ රැස්කිරීම සහ මුදල් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම;

එසේ වුව ද, සංස්ථාව වෙත ලබාදෙනු ලබන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මණ්ඩලය විසින් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය.

(ඉ) විනමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීමට, ලිවීමට, භාරගැනීමට, වට්ටම් දීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට සහ නිකුත් කිරීමට සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට;

(ඊ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකින් ආයෝජනය කිරීමට;

(උ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව යම් නීත්‍යානුකූල භාරයක් හෝ නිශ්චල හෝ පෞද්ගලික

දේපලක් භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටුකිරීමට සහ පරිපාලනය කිරීමට;

(ඌ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත්කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාව විසින් තීරණය කරනු ලැබිය හැකි වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීමට;

(එ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන, සම්මන්ත්‍රණ, සම්මේලන සහ අවස්ථා සංවිධානය කිරීම;

(ඒ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය සහ විදේශීය අනෙකුත් ආයතන සමග සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම සහ බැඳීම් සහගත ගිවිසුම්වලට ඇතුළත් වීම;

(ඔ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයන්හි දී සේවක පිරිස් පුහුණු කිරීම;

(ඕ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ සුදුසු වෙනත් සියලු දේ සිදු කිරීම; සහ

(ක) ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි රාජ්‍ය ක්‍රියාකාරීන් සමග ගිවිසුම්, අවබෝධතා ගිවිසුම් (MOU) සහ ප්‍රකාශන සඳහා අත්සන් කිරීම.

7. (1) සංස්ථාව විසින්, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන්නා වූ රීති, පහත සඳහන් සියලු කරුණු සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල විය යුතු ය:— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) සභාවේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ පත්කිරීමේ නියම සහ කොන්දේසි, ඔවුන්ගේ බලතල, කාර්යය සහ කර්තව්‍යයන්;

(ඈ) සභාවේ හෝ එහි යම් අනු කමිටුවක රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීම් පිළිබඳ දැන්වීම් හා න්‍යාය පත්‍ර, ගණපූර්ණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) සංස්ථාවේ සහ සභාවේ සාමාජිකයකු වීමට අවශ්‍ය සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) සංස්ථාවේ දේපල, පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම; සහ

(උ) පොදුවේ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත්කර ගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන්, එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සෑම කල්හිම සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

(4) මෙම වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ සාමාජික ලේඛනය.

8. සාමාජිකයන්ගේ නම්, ලිපින සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරනු ලැබිය යුතු සාමාජිකයන්ගේ ලේඛනයක් සභාව විසින් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාව සඳහා සහ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලුම මුදල්, සභාව විසින් අනුමත කරන ලද එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලුම මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**10.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාර සංස්ථාවේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් හෝ විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නා වූ ද, එමෙන්ම ගණකාධිකාරිවරයකු

වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි ගණකාධිකාරි සමාගමක්,

අදහස් වේ.

**වාර්ෂික වාර්තාව.**

**11.** (1) සභාව විසින් සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහා සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමග ඒ වාර්තාව අදාළවන වසරට පසුව එළඹෙන වර්ෂයේ සය මාසයක් ඉකුත්වීමට පෙර ක්‍රීඩා විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත සහ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයාවෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාව වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුම් ප්‍රකාශයක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සමග යැවිය යුතු ය.

**ආයතනය විසින් ගෙවිය යුතු සහ ආයතනයට අයවිය යුතු ණය මුදල්.**

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනය විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට ආයතනයට අයවිය යුතු සියලු ණය සහ ආයතනයට ගෙවිය සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපල දැරිය හැකි බව.**

**13.** යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව සතුවන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයෙන් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපල දැරිය යුතු ය.

*මුදල් සහ දේපල අදාල කර ගැනීම.*

**14.** කවර ආකාරයකින් හෝ ලබා ගන්නා සංස්ථාවේ මුදල් හා දේපල, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම කෙරෙහි පමණක් අදාළ කර ගත යුතු අතර, එයින් කවර හෝ කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ මුදල්, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

*සංස්ථාවේ මුද්‍රාව.*

**15.** (1) සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව, කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාවේ මුද්‍රාව, සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි සභාවේ යම් ධුර දරන්නකුගේ භාරයේ තිබිය යුතු ය.

*විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපල.*

**16.** (1) සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරිවී තිබුණහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර, බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය සංස්ථාව විසුරුවා හැරීමට පෙරාතුවම සංස්ථාවේ සාමාජිකයන් විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

*ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

**17.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් ඇති නොවිය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**18.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.